3 වන පිටෙන්

බලන්න රටේ බඩුමිල. හැම බඩුවක්ම මිල දවසින් දවස වැඩි වෙනවා. රටේ නිෂ්පාදනයක් නැහැ. බඩු මිල වැඩි වුණාට දුප්පතාගේ පඩිය වැඩි වෙන්නේ නැහැ. මිනිස්සු කොහොම කාලා ඇඳලා ඉන්නවද කියලා පාලකයන්ට වගේ වගක් නෑ. හැබැයි ඒ ගොල්ලන්ගේ පඩිය නම් වැඩි කර ගන්නවා. එහෙම නම් මහත්තයෝ මේ නිදහස් දවසට අපි කරන්නේ ඕනෑ නිදහස් චතුරශ්‍රයට ගිහින් නැති නිදහසක් ගැන බොරු සැමරීමක් කරන එක නෙමෙයි. මුළු ජනතාවම ගෝල්පේස් එකට ගිහිල්ලා මහ මුහුද දිහා බලාගෙන හඬන එකයි.....?

සෝභිත ස්වාමීන් වහන්ගේ ඉතා දීර්ඝ වූ විස්තරයෙන් මට මතක ඇති කරුණු විතරක් ඉහතින් සඳහන් කළ බව සලකන්න.

'සන්නසේ' දේශපාලන කොළඹට සෝභිත ස්වාමීන් වහන්සේගේ කතාවක් පටලවා ගත්තේ මොකටද? සමහරුන්ට දූන් එහෙමත් හිතෙනවා ඇති. මේකයි හේතුව. සෝභිත හාමුදුරුවන්ගේ කතාවේ දැවැන්ත දේශපාලන යථාර්ථයක් තියෙනවා. උන්වහන්සේ ඉහත මා සමග සඳහන් කළ කාරණා සක්විති රජුටවත් නැහැයි කියන්න බැහැ. එහෙම නම් අපේ රටේ දුප්පත් අසරණ වැසියන්ගේ ජීවිත ගැන තුට්ටුවකවත් වගකීමක් නැත්තේ කාටද? දේශපාලනඥයන්ට නේද?

ජනතාව ඔවුන්ට ඡන්දය දීලා බලයට පත් කරන්නේ රටටත්, වැසියන්ටත් වගතුවක් බලාපොරොත්තුවෙන්. ඒත් අන්තිමට මොකක්ද වෙන්නේ. අවුරුදු පහක් හයක් තිස්සේ බයිලා කියලා ඡන්දෙනුත් පැරැදිලා විපක්ෂයට යනවා. නිකම්ම නෙමෙයි. හිටපු අවුරුදු පහ හයේදී පරම්පරා හය හතකටම හම්බ කරගෙන. ඔන්න ඊට පස්සේ අනිත් ගෲප් එක එනවා. අර ගොල්ලන්ගේ බයිලා මේ ගොල්ලෝ 'රැප්' කරලා ගහනවා. රැප් බයිලාවට රැවටෙන ජනතාව විසිල් ගහනවා. අත්පුඩි ගහනවා. ඒත් ජනතාව දන්නේ නැහැ. දවසින් දවස විශාල අඳුරු අගාධයකට ඇදී යන බවක්. බඩපොත්ත තවත් හාමත් වෙන බවක්.

මේ දේශපාලන යථාර්ථය ජනතාවට හීනයක්. රෑ දවල් වෙනසක් නැතුව ජනතාව මේ දේශපාලන යථාර්ථවාදී හීනය දක්කා. මේ හීන දැකිල්ල කම්මුතු කරන්න ජනතාව තීරණයක් ගත්තා. ඒ තමයි අළුත්ම අළුත් නායකයෙක්ට රට බාර දීම. ජනතාවගේ ඒ අහිංසක අපේක්ෂාව මල්ඵල ගැනුනා. මහින්ද රාජපක්ෂට රට භාර වුණා. මහින්ද රටේ ජනාධිපති වුණා.
ඇයි ජනතාව මහින්ද රාජපක්ෂව රටේ ජනාධිපති කළේ. ඒ ප්‍රශ්නයට ප්‍රශ්නවලින්ම පිළිතුරු දුන්නේ මාදුළුවාවේ සෝභිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ. ශ්‍රී ලංකාවට දූන් නිදහස ලැබිලා අවුරුදු පනස් හතක් සම්පූර්ණයි. ඩී.ඇස්. සේනානායක, සර් ජෝන් කොතලාවල, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක සහ සිරිමාවෝ බණ්ඩාරනායක යුගවල රටේ සංවර්ධනයක් සිද්ධ වුණා. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ. එදා රජයේ සේවකයන්ට අද වගේ ඉලක්කම් හතරේ පහේ පඩි ලැබුණෙත් නැහැ.
බෙල්ලන්විල රජමහ විහාරාධිපති බෙල්ලන්විල විමලරතන හිමියෝ දවසක් මට කිව්වා. උන්වහන්සේගේ පියා එදා දුම්රිය සේවකයෙක් හැටියට ලැබුවේ රුපියල් 250 ක පඩියක් කියලා. හැබැයි ණයක්, බරක් නැතුව ඒ පඩියෙන් මුළු පවුලම ජීවත් වුණා කියලත් කිව්වා.

සොච්චම් පඩියක් එදා ලැබුණත් ඒකෙන් ජීවත් වෙන්න පුළුවන්කම රජයේ සේ-වකයාට එදා තිබුණා. ඒ වගේම රටේ කෘෂිකර්මාන්තය තිබුණෙත් ඉහළ අඩියක. මේ නිසා වගාව විකුණා ගන්න බැරුව ගොවීන් දිවිනහ ගත්තේ නැහැ. ගොවි දරු පවුල් එදා යුගයක ගැලපෙන පරිදි සරු ජීවිතයක් ගත කළා. ඒ දරු-වෝ හොඳින් අධ්‍යාපනය හදාරලා ලංකාවේ විතරක් නෙමෙයි දේශ දීපංකරවලත් ඉහළ තනතුරුවලට පත්වුණා. ඒ වගේම රෝහල් සේවා. ප්‍රවාහන සේවා, වාරිමාර්ග, සංස්කෘතිය, බුද්ධ ශාසනය ඇතුළු සෑම විෂයකින්ම එදා ජනතාවට සෙතක්, සේවයක් සැලසුනා.

මේ විදිහට තිබුණ රත්තරන් වටිනා රටක් ජනතාවට අහිමි කළා. ඒ කවුද? නිල්පාට සහ කොළපාට සමහර බලලෝභි ආත්මාර්ථකාමී දේශපාලකයෝ. බලාගෙන ඉඳිද්දී රට පිරිහෙන්න පටන් ගත්තා. ඒ පිරිහුන පිරිහිල්ලේ තරම තමයි සෝභිත හාමුදුරුවෝ ප්‍රකාශ කළේ. ජනතාවට බොරු පොරොන්දු ගෙ‍ග්නි ගණන් දුන්නත් ජේ.ආර්., චන්ද්‍රිකා, රනිල් වැනි

**නමුත් ගෞරවන්විතව රනිල් පක්ෂ නායකකමින් ඉවත් වුණොත් එජාපයේ ඊළඟ නායකයා කවුද? රනිල් වැනි දේශපාලන අත්දැකීම් තිබෙන ජාත්‍යන්තර සබඳකම් ඇති තවත් නායකයෙක් එජාපයට සිටිනවාද? කෙටිම පිළිතුර 'නැත' යන්නයි.**

නායකයන්ට බැරි වුණා රට වැටී තිබුණ වළෙන් අඩියක්වත් උඩට ගන්න. හැබැයි ජනාධිපති ආර්. ප්‍රේමදාස උත්සාහ ගත්තා.
''ප්‍රේමදාස කුකුල් කූඩු බෙදනවා'' කියලා එදා ශ්‍රීලනිපයේ ලොක්කෝ ප්‍රේමදාසට අවලාද කිව්වත් ඔවුන්ට බැරි වුණා ජනතාවට මී කූඩුවක්වත් දෙන්න. ලක්ෂ ගණන් ගෙවල් හදලා ප්‍රේමදාස බෙදුවා. නවීන මහා මාර්ග පද්ධති ඉදිකළා. අවුරුදු සිය ගණන් තිස්සේ ජරාවාස වෙමින් තිබූ ඉපැරණි වෙහෙර විහාරස්ථාන පිළිසකර කළා. කිසිදාක නගා සිටුවන්න බැහැයි කියා පැත්තක දමා තිබූ  දැවැන්ත බුදුරුවගල බුදු පිළිම වහන්සේ සිටුවා ප්‍රතිෂ්ඨාපනය කළා.

මේ හැම දෙයක්ම ප්‍රේමදාස කළේ ඔක්ස්ෆර්ඩ් ගිහිල්ලා ඉගෙන ගෙන උපාධි අරගෙනවත්, පරම්පරාවේ පම්පෝරිය හින්දවත් නෙමෙයි. ප්‍රේමදාසට පරම්පරාවේ පම්පෝරියක් තිබුණෙත් නැහැ. විශ්ව විාල උපාධි තිබුණෙත් නැහැ. ඔහුට තිබුණේ 'සමා-ජය කියන විශ්ව විාලයේ' උපාධිය විතරයි. ඒ විශ්ව විාලය තිබුණේ කොළඹ කෙසෙල්වත්තේ. ඒ විශ්ව විාලයේ ජීවත් වුණේ හරියට අඳින්න, කන්න, බොන්න නැති දුප්පත්තු. ඔවුන්ගේ දුක සංතාපය හරහා ප්‍රේමදාස මුළු රටේම පීඩිත පංතියේ ප්‍රශ්න හඳුනා ගත්තා. දේශපාලන කනා සාප්පු වසා දමා ප්‍රේමදාස වැඩට බැස්සා. වලව්කාර දේශපාලනයටයි, ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් දර්ශනවාදී දේශපාලනයටයි තරු විසි-වෙන විදිහට ප්‍රේමදාස ජනතාවට සේවය කරන්න පටන් ගත්තා. ඒ හින්දයි 'කෙසෙල්වත්තේ කොල්ලෙක්' රටේ ජනාධිපති පදවියට පත්වුණේ. (ප්‍රේමදාස මහතාගේ දේශපාලන ජීවිතයේ නොමනා පුද්ගලයන් ඇසුරත්, ඒ නිසා ඔහුට සිදුවූ දේශපාලන පරිහානියත් වෙනම කතා කළ යුතු මාතෘකාවක්)

කොහොම වුණත් පිටරට විශ්ව විාලවලින් ඉගෙන ගත්ත චන්ද්‍රිකාටවත්, රනිල්ටවත් බැරි වුණා දුප්පතාගේ දුක තේරුම් ගන්න. මේ දෙන්නටම ලක්ෂ ගණන් ඡන්ද දුන්නේ ගම්වල මිනිස්සු. ඒත් ගම්වලට මේ දෙන්නම දුන්න දෙයක් නෑ. ''දුන්නා.... දුන්නා....' කියල නං කියනවා. ඒත් සෝභිත හිමියන්ගේ ප්‍රකාශ දිහා බලපුවහම දිපූ 'කෙංගෙඩියක්' නෑ. අඩුම තරමේ අස්-වනු විකුණා ගන්න බැරුව දිවිනහ ගන්න ගොවීන්ගේ වී වගාවත්, මුළු මහත් රටේ කෘෂිකර්මාන්තයත් නගා සිටුවන්න ජාතික වැඩපිළිවෙළක් මේ දෙන්නටම ආරම්භ කරන්න බැරි වුණා. ඒ වෙනුවට වරක් රනිල් කිව්වේ කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන පුරන් කුඹුරු ගොඩ කරලා කර්මාන්තශාලා හදන්න දෙන බවයි. රනිල්ටවත්, චන්ද්‍රිකාටවත් දේශීය චින්තනයක් නැති බව ජනතාව කල් ගිහින් හරි තේරුම් ගැනීම වාසනා-වක්. ඒ හින්දම තමයි රනිල් චන්ද්‍රිකා යුග කොළඹ කටුගෙට පිටත් කොට මහින්ද රාජපක්ෂ නමැති ස්වර්ණමය පරිච්ඡේදය නොවැම්බර් 17 වැනිදා සිට ආරම්භ කරන්නට ජනතාව තීන්දු තීරණ කළේ.
මහින්ද රාජපක්ෂට උතුරු නැගෙනහිර දෙමළ, මුස්ලිම් ඡන්ද වැටුනේ නැහැ. ඒක වෙනම කතාවක්. ඒත් එතුමා දූන් මුළු රටේම ජීවත්වෙන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී සියලුම ජාතීන්ගේ නායකයා. මේ හැම මනුස-්සයෙක්ටම බලපාල තියෙන්නේ එකම ප්‍රශ්න මාලාවක්. කොටි සංවිධානයක් බිහිවීමත්, ඔවුන් යුද වැදීමත් අද ඔවුන් වෙනම දේශයක් ඉල්ලීමත් යන කාරණා ගැඹුරින් සාකච්චා කළොත් එය කෙළවර වන්නේ ඔවුන්ට බලපෑ කෘෂිකර්මාන්තය, වාරිමාර්ග, අධ්‍යාපනය වැනි ප්‍රශ්න ඉදිරියේ. ඒ කියන්නේ සෝභිත හිමි වදාල වර්තමාන ප්‍රශ්න අතීතයේ පටන් උතුරු නැගෙනහිර ජනතාවටත් බලපා තිබූ බවයි. ඒවාට දේශපාලනඥයෝ විසඳුම් ලබා නොදුන් බවයි.

ජනතාව මහින්ද රාජපක්ෂ තෝරා ගත්තේ මේ ප්‍රශ්න විසඳා ගන්නයි. මහින්ද ගමේ ඉපදුන කෙනෙක්. අවුරුද්දේ තුන්සිය හැටපස් දවසේම ඉඩෝරයෙන් බැට කන හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලනඥයෙක්. කෘෂි කර්මාන්තය, වාරි කර්මාන්තය, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන වැනි

**ජනතාව මහින්ද රාජපක්ෂ තෝරා ගත්තේ මේ ප්‍රශ්න විසඳා ගන්නයි. මහින්ද ගමේ ඉපදුන කෙනෙක්. අවුරුද්දේ තුන්සිය හැටපස් දවසේම ඉඩෝරයෙන් බැට කන හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලනඥයෙක්.**

අංශවලින් ගමේ ජනතාවට මොන තරම් සේවයක් සැලසේනවා දැයි මහින්ද රාජපක්ෂ දන්නේ ඒ අඩුපාඩු වලින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව අදටත් තැලුම් කන නිසයි. ඒ හින්දා මහින්දව මම දකින්නේ වැඩ කළ ප්‍රේමදාස මෝඩලයේ චරිතයක් විදිහට. මහින්ද රාජපක්ෂ කියන්නෙත් මනුස-්සයෙක්. විශ්ව කර්මයෙක් නෙමෙයිනේ. මෙතනදී මහින්දගේ සහයට ජනතා විමුක්ති පෙරමුණ සිටීම ඉතා වැදගත්. මහින්දගේ වටා සිටින ශ්‍රීලනිපයේ දේශපාලනඥයන්ගෙන් රටට වැඩක් කරන්න අවංක හැඟීමක් තිබෙන අය හතර පස් දෙනෙකුට වඩා නැති තරම්. අනිත් ඔක්කොම 'කතා සාප්පු කාරයෝ'. 'මට මතක ඇති විදිහට මහින්ද දේශපාලනයට ආවේ 1970 දී. එදා ඉඳලා 2005 දක්වා කතාසාප්පුකාර දේශපාලනඥයන් සමග මහින්ද ආව ගමන හොඳටෝම ඇති කියලයි මට නම් හිතෙන්නේ. රටට අළුත් දර්ශනයක්, නායකත්වයක් සහ රටේ සංවර්ධනයක් ඉක්මනට පටන් ගන්න ඕනේ නම් කතාසාප්පුකාර දේශපාලනඥයන්ට ගෞරවාන්විතව දේශපාලනයෙන් සමුගන්න ඉඩ දීලා ශක්තිමත් හා අවංක ජවයක් සමග මහින්ද ගමන ආරම්භ කරන්න ඕනේ. දිවයිනේ සතරදිග් භාගයේම සංවර්ධන වැඩ කටයුතු ඇරඹෙන්න ඕනේ. හැබැයි හාල් පොලු, මිරිස් පොලු නැතුව.
ඒ මොකද දන්නවාද? විපක්ෂයේ විතරක් නෙමෙයි ශ්‍රීලනිපයෙන් සමහරු දූන් බලාගෙන ඉන්නේ මහින්ද 'ඇනගන්න' තුරු. ඒකට මහින්ද ඉඩ නොතබන බවයි ජනතාවගේ විශ්වාසය.

මහින්දගේ ජයග්‍රහණයෙන් පස්සේ විපක්ෂයත් සමග කිට්ටු සම්බන්ධකම් තිබෙන පුද්ගලයෙක්ට දුරකතනයෙන් මම කතා කළා. එයා කිව්වා මේ විදිහට. ජාතික හෙළ උරුමය ඉන්නේ එක ස්ථාවරයක. ජවිපෙ තවත් ස්ථාවරයක. ශ්‍රිලනිපය තවත් තැනක.  මහින්ද රාජපක්ෂ ඉන්නේ කොතැනද කියලා හරියට කියන්න බැහැ.

ඒ කතාව හරියට හරි. මහින්ද රාජපක්ෂ ඉන්න ඕන තැන එතුමා හිඳීවී. ඒ මොකද? එතුමා ශ්‍රිලනිප, ජවිපෙ හෝ හෙළ උරුමය නොවන නිසා. එතුමා සමස්ත ජනතාවගේම නායකයා නිසා. මුළු රටේම අනාගත අභිවෘද්ධිය එතුමා නිසා.
ජනාධිපතිවරණය අවසන්. මහින්ද රාජපක්ෂ රටේ ජනාධිපති වුණා. ඊළඟට එජාපයේ ඉරණම මොකක් වේවිද? ඒ කියන්නේ එජාප නායක රනිල් වික්‍රමසිංහගේ ඉරණම? රනිල් දෙපාරක් ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා. දෙපා-ාරම පරාදයි. ජනාධිපති තනතුර දෙපා-ාරකට වඩා දරන්න බැහැ කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්. දෙපා-ාරක් ජනාධිපතිවරණයට ඉදිරිපත් වී